# දඹදෙණි යුගයේ දේශපාලන තත්ත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ශ්‍රීපාලි, ඊ.* [1]

ශ්‍රී ලංකා ඉතිහාසයේ දඹදෙණි යුගය තුන්වන රාජධානිය වේ. (ක්‍රි. ව. 1215-1270) මෙම යුගයේ රජරට ශිෂ්ටාචාරයම පරිහානියට ලක් වූ මාඝ ආක්‍රමණය නිසා ලාංකීය කුමාරවරු තම ආරක්ෂාව පතා නිරිත දිගට සංක්‍රමණය විය. මෙහි ආරම්භක පාලකයා III විජයබාහු රජු වූ අතර, ශ්‍රේෂ්ඨතම පාලකයා II පරාක්‍රමබාහු රජු වේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ දඹදෙණි යුගය තුළ රටේ දේශපාලන තත්ත්වය පිළිබඳ කරුණු විග්‍රහ කිරීමය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ දඹදෙණි යුගයේ දේශපාලන තත්ත්වය කවරේද යන්නය. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් මහාවංසයද, ද්විතීයික මූලාශ්‍රය ලෙස දඹදෙණි යුගය පිළිබඳ පසුකාලීන උගතුන් විසින් රචිත කෘතිද භාවිත කරනු ලබයි. මෙහි අන්තර්ගතය වන්නේ දඹදෙණි යුගයෙහි සිටි පාලකයන් වූ III විජයබාහු, II පරාක්‍රමබාහු, IV විජයබාහු ආදි පාලකයන් හා ඔවුන්ගේ දේශපාලන කටයුතු පිළිබඳ සොයා බැලීමය. දඹදෙණි යුගයේ දේශපාලනය බාහිර තර්ජනවලට මුහුණ දුන් නමුදු යහපත් දේශපාලන පසුබිමක් තිබූ බව මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකි වේ.

**ප්‍රමුඛ පද:** දේශපාලන පසුබිම, රජරට ශිෂ්ටාචාරය, දඹදෙණි යුගය

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) දෙවන වසර, ඉතිහාසය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*sripalimaduwanthika@gmail.com*